දරුවන් උදෙසා
බයිබලයක්



# ස්වර්ගය
# දෙවියන්
# වහන්සේගේ
# අලංකාර
# නිවහනයි

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Lazarus

සකස්කරන්නා: Sarah S.

අදහසක් වඩා සරල ස්වරූපයකින් ප්‍රකාශ කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2013 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

මෙලොව ජේසුස් වහන්සේ ජීවත් වූ කාලයේදී ගෝලයන්ට උන් වහන්සේ ස්වර්ගය පිළිබඳ වදාළ සේක. එය පියාණන් වහන්සේගේ ගෘහය ලෙස සැලකූ අතර එහි බොහෝ මන්දිර ඇති



බව පැවසුවා.

මෙම මන්දිරය අලංකාර විශාල නිවසකි.
මිහිපිට නිවාසවලට වඩා
ස්වර්ගයේ නිවස ඉතා
විශාල අලංකාර
නිවසක් විය.



’’මම ඔබට ස්ථානයක් පිලියෙළ කිරීමට යමි, එය පිළියෙළ කොට නැවත පැමිණ ඔබ ද රැගෙන යමි’’ යි ජේසුස් වහන්සේ වදාළ සේක.



ජේසුස් වහන්සේ මළවුන්ගෙන් නැගිටීමෙන් පසු ස්වර්ගයට නැගුණු සේක. ගෝලයන් බලා සිටියදීම ජේසුස් වහන්සේ ඉහළට ඔසවා ගනු ලැබ වලාකුළකින් සැඟවී ගිය සේක.



මෙතෙක් ජේසුස් වහන්සේ මතක් කරමින් හා පොරොන්දු වෙමින් කියනුයේ කිතුනුවන් රැගෙන යාමට උන් වහන්සේ නැවත පැමිණෙන බවයි.

බලාපොරොත්තු නොමැති වේලාවක ජේසුස් වහන්සේ




ඉක්මනින් නැවත පැමිණෙන සේක.

එහෙත් ජේසුස් වහන්සේගේ ඒමට ප්‍රථමයෙන් මරණයට පත්වන කිතුනුවන්ට කුමක් සිදු වේද? බයිබලය පවසන්නේ ඔවුන් කෙළින්ම ජේසුස් වහන්සේ සමඟ ජීවත් වන බවයි. ශරීරාකාර මරණය ජේසුස් වහන්සේ




සමඟ ජීවත් වීමයි.

බයිබලයේ අවසන් පොත වන එළිදරව් පොතෙන් ස්වර්ගය ඉතා අලංකාර තැනක් බව අපට වැටහේ. ඉතාමත් චමත්කාර ජනක දෙය නම් ඉතා විශේෂ ආකාරයකින් ස්වර්ගය දෙවියන් වහන්සේගේ වාසස්ථානය වීමයි.



දෙවියන් වහන්සේ සෑම තැනම වැඩ සිටින බවත් උන් වහන්සේගේ සිංහාසනය ස්වර්ගයේ ඇති බවත් අපට පෙනේ.



දේවදූතයෝ හා ස්වර්ගීක
පැවැත්ම ස්වර්ගයේදී දෙවියන්
වහන්සේට නමස්කාර කරති.
ඔවුහු විශේෂ ගීතිකාවලින්
ද දෙවියන්
වහන්සේට
ප්‍රශංසා
කරති.



ඔවුන් ගයන ගීතයක වචන ස්වල්පයක් මෙසේය: සියලු ජාතීන්ගෙන් සියලු ගෝත්‍රයන්ගෙන් අප මුදාගෙන, . . .



. . . සියලු පාපයන්ගෙන් අප මුදාගෙන ඔබ වහන්සේ වෙතට පූජකයන් හා රජවරුන් ලෙස අප පත්කර ඇති නිසා අපි ඔබ උසස් කරන්නෙමු.



ස්වර්ගය ''නව ජෙරුසලම'' යයි බයිබලයේ අවසාන පිටු කියවීමෙන් දැනගත හැක. එය ඉතාමත් විශාලයි. එහි පිටත විශාල බිත්ති ඇත.



ඉතා පැහැදිලි දීප්තිමත් මැණික්වලින් බිත්ති දිලිසේ. ඉතා ලක්ෂණ වර්ණවලින් බැබලේ. නගරයේ සෑම දොරටුවක්ම සාදා ඇත්තේ විශාල මුතුවලින් ය.



බිත්තියේ අත්තිවාරම රත්තරං හා අනඟි ගලින් නිම විය. විවිධ වර්ණවලින් එය දිස්නය දෙයි. නගරයේ සෑම දොරටුවක්ම මුතුවලින් සාදා ඇත.



එම අනඟි මුතු දොරටු කිසි දා නොවසයි. අපි ඇතුළුව බලමු. .......කොතරම් අනඟි ද ! !



ස්වර්ගය ඇතුළ ඊටත් වඩා ලස්සණයි. එම නගරය වීදුරුවලටත් වඩා පවිත්‍ර රනින් නිම වී ඇත.



දෙවියන් වහන්සේගේ සිංහාසනයේ සිට ඉතා අලංකාර පැහැදිලි ජීවනයේ නදිය ගලයි. නදියේ අනෙක් පසින් ජීවනයේ ගසයි. මෙය පළමුවෙන්ම සොයාගත්තේ ඒදන් උයනේදීයි. මෙම ගස ඉතා විශේෂයි.



සෑම මසකටම එක පලතුරක් ලෙස එහි විවිධාකාර පලතුරු වර්ග දොළහක් පල ගනී. මෙම ජීවන ගසේ පත්‍රවලින් දේශයට සුවය ලැබේ.



ස්වර්ගයට ආලෝකය සඳහා ඉර හඳ අවශ්‍ය නැත. දෙවියන් වහන්සේගේ මහිමයෙන් එහි අලංකාර ආලෝකයක් ඇත. එහි රාත්‍රියක් කිසිදා නොවන්නේ ය.



ස්වර්ගයේ සිටින සතුන් පවා වෙනස්ය. සියලු සතුන් ඉතා මිත්‍රශීලී ය. හීලෑ ය. වෘකයා බැටළු පැටවා එකට තණකොළ කයි. බලවත් සිංහයින් පවා ගවයකු ආකාරයට පිදුරු කයි.



ශුද්ධවූ කන්දේදී ඔවුනට විනාශය හෝ දුක ඇති නොවේ යයි සමිඳාණන් වහන්සේ පවසන සේක.



ස්වර්ගයේ නැති කාරණා කිහිපයකුත් අපට දක්නට ලැබුණා. නපුරු වචන එහි තවත් ඇසෙන්නේ නැත.



අමනාපකම් සහ ආත්මාර්ථකාමීත්වය එහි
තවත් නැත. සොරුන් නොමැති නිසා
එහි දොරවල
අගුලු
දමා
නැත.



එහි බොරුකාරයෝ නැත. මිනිමරුවෝ නැත.
මායාකාරයෝ සහ වෙනත් නපුරු
මිනිස්සු නැත.
ස්වර්ගයේ
කිසිදු
පාපයක්
නැත.





ස්වර්ගයේ දෙවියන්
වහන්සේ සමඟ තවත්
කඳුළු සැලීමක් නැත.
හැඬීමක් ද නැත.
සමහර විට මේ
ලෝකයේ වේදනාවන්
නිසා මිනිස්සු හඬයි.
ස්වර්ගයේදී දෙවියන්
වහන්සේ කඳුළු පිස
දමන සේක.

මරණය තවත් ස්වර්ගයේ නැත. එනමුත් දෙවියන් වහන්සේගේ සෙනඟ උන් වහන්සේ තුළ සැමදා ජීවත් වෙති. එහි තවත් කඳුළු සැලීමක් නැත.



හැඬීමක් ද නැත. එහි වේදනාව ද නැත. රෝග නොමැත. වෙන්වීමක් නැත. මරණය නැත. ස්වර්ගයේ සිටින සැම දෙනෙක්ම දෙවියන් වහන්සේ සමඟ සැමදා ප්‍රීතියෙන් සිටිති.



සියල්ලට වඩා යහපත් දේ නම් ස්වර්ගය පිරිමි ළමුන්ට හා ගැහැණු ළමයින්ට ය. (වැඩිහිටියන්ටත් අයිතිය.)



ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි අදහන්නාවූ ඔවුන්ගේ ජීවිතවල ගැළවුම්කරුවාණන් ලෙස පිළිගන්නා වූත් දේව වචනයට කීකරු වන්නාවූ සැමටත් ස්වර්ගය හිමි වේ.



බැටළු පැටවාණන්ගේ ජීවන පොත යන්නෙන් ස්වර්ගයේ පොතක් ඇත. එය මනුෂ්‍යයන්ගේ නම්වලින් පිරී ඇත. ඔබ දන්නවා ද එහි ලියා ඇත්තේ කාගේ නම් ද කියා?

ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය තබන සියල්ලන්ගේ නම් ය. ඔබේ නමත් එහි ඇති ද?



# ස්වර්ගය පිළිබඳ ඇති බයිබලයේ අවසාන පද විස්මිත ආරාධනාවකි.



ආත්මයාණන් වහන්සේ හා මනාලිය පවසන්නේ
''එන්න'' කන් ඇත්තෝ අසාවා, පිපාසය
ඇත්තෝ පැමිණෙත්වා, කැමැත්තෙන් සිටින
ඕනෑම කෙනෙකුට ජීවනයේ වතුර නොමිලයේ
ලැබේ.



ස්වර්ගය දෙවියන් වහන්සේගේ අලංකාර නිවහනයි

දේව වචනයෙන් එක් කථාවක්

බයිබලයේ

ශුද්ධවර ජොහන් 14; 2 කොරින්ති 5
එළදරව්ව 4:21-25

''ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ''
ගීතාවලිය 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ
නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ
කතා කරන්න (ශු. ජොහන් 3:16)